මැතිවරණ කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

தேர்தல் ஆணைக்குழு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Election Commission**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)**

ආකෘති අංක - 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : මැතිවරණ කොමිෂන් සභාව

| කමිටුව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු | | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගන්නා ලද ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය |
|---|---|---|
| 01 | 2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබීම. | මැතිවරණ කොමිෂන් සභාවේ ස්ථාවර වත්කම් ලේඛනය යථාවත් කිරීම හා එම යථාවත් කළ ස්ථාවර වත්කම් ලේඛනය CIGAS වැඩසටහන සමග ගැලපීමේ කාර්යයන් දිගින් දිගටම සිදුකළ බැවින් එම කාර්යයන් අවසන් වනතුරු මෙම තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. දැනට එම කාර්යය අවසන් වී ඇති බැවින් 2026 වර්ෂයේ සිට අදාළ පරිදි වාර්තා කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. |
| 02 | සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 හා 104 ව්‍යවස්ථා අනුව මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නිදහස්, සාධාරණ හා විශ්වසනීය ඡන්ද විමසීම් පැවැත්වීම සිදු කරයි. සියලු මැතරවණ පාර්ශ්ව සමඟ අපක්ෂපාතීව කටයුතු කිරීම අවැසි හෙයින් ද, "මැතිවරණ කොමිෂන් සභාව" යනුවෙන් ලේබලයක් පමණක් වාහනවල ප්‍රදර්ශනය කිරීම සිදු වේ.<br><br>එසේම, ඡන්ද විමසීම් අවස්ථාවල දී, ඡන්ද විමසීම්වලට අදාළ ආරක්ෂිත සහ රහස්‍ය ලේඛන, මැතිවරණ කොමිෂන් සභාව සතු වාහනවල රැගෙන යන හෙයින් පහසුවෙන් ඒවා කඩාකප්පල්කාරී කණ්ඩායම්වලට ඉලක්ක විය හැකි හෙයින් ද, පවතින නෛතික ප්‍රතිපාදන, මැතිවරණ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය, මධ්‍යස්ථභාවය පිළිබඳව සලකා බලමින් කටයුතු කරනු ලබන අතර, මැතිවරණ කොමිෂන් සභාව සතු වාහන ධාවනය කරන ආකාරය/ ඒ පිළිබඳව අභ්‍යන්තර පාලන සඳහා VMS (Vehicle Management System) පරිගණක වැඩසටහනක් සහ වෙනත් ආකාරයේ පරිපාලන ක්‍රමවේද භාවිතා කිරීම තුළින් ද සිදුකරනු ලැබේ. |

| | | |
|---|---|---|
| 03 | සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබීම. | රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම යන මැයෙන් වන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 02/2018 හා 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය මගින් කාර්යය මණ්ඩලයේ කාර්යය සාධන ඉහළනංවා ගැනීම පිණිස කාර්යය සාධන පත්‍රිකාවනට අමතරව කාර්යය යසාධන ගිවිසුම් අත්සන් කිරීම හඳුන්වා දී ඇති අතර, පසුව ඉහත මැයෙන් වන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 02/2018 (1) හා 2023.11.30 චක්‍රලේඛය මඟින් රා.ප.ච. 02/2018 හි (1) ඡේදය සංශෝධනය කරමින් එහි සඳහන් පරිදි "වාර්ෂික කාර්යය සාධන ගිවිසුම්" අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දක්වා ඇත. කරුණු එසේ හෙයින් තවදුරටත් වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කිරීම සිදු නොකරන අතර නිලධාරීන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීම සඳහා ඉහත චක්‍රෙල්ඛ මගින් දන්වා ඇති පරිදි කාර්යය සාදන පත්‍රිකාවන් විධිමත් පරිදි සම්පූර්ණ කිරීමටත්, යොදා ගැනීමටත් කටයුතු කරන අතර රා.ප.ච. 02/2018 හි (1) මගින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම වාර්ෂිකව සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම විධිමත් පරිදි සදු කරන බව දන්වන අතර, ඒ මත පදනම්ව මෙයට පෙර වර්ෂවලදී ද ප්‍රගතිය වාර්තා කර ඇත. |

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

රසික පීරිස්
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාවත, රාජගිරිය.

නම : රසික පීරිස්

තනතුර : මැතිවරණ කොමසාරිස් ජනරාල්

දිනය : 2026.06.